# අධ්‍යාපන අමාත්‍යාංශය

## ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය (SLIATE)

# පුරප්පාඩු

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ (SLIATE) හා පවතින පහත සඳහන් තනතුරු සඳහා මෙයින් අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්පත් 2022.01.26 වන දින හෝ ඊට පෙර ලැබෙනසේ කොළඹ 10, T. B,. ජයා මාවාතේ අංක 320, "ජනවතු පියස", හි, ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ (SLIATE) හි අධ්‍යක්ෂක වෙත ලේඛනගත කළ තැපෑලෙන් එවිය යුතුය.

කරුණාකර ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ, අයදුම් කරනු ලබන තනතුර පැහැදිලිව සටහන් කරන්න.

### 01. නියෝජ්‍ය අධ්‍යක්ෂක ජනරාල් (අධ්‍යයන කටයුතු / සැලසුම් හා පර්යේෂණ) - ප්‍රධාන කාර්යාලය - (පුරප්පාඩු 01)

**අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :**

**අභ්‍යන්තර අපේක්ෂකයින් :**

(අ) අදාළ විෂය ක්ෂේත්‍රයක මාස්ටර් (විද්‍යාපති / ශාස්ත්‍රපති) (පශ්චාත්) උපාධියක් සමග SLIATE හි හෝ ATI හි, 1 අධ්‍යක්ෂකවරයෙකු ලෙස වසර 5 (පහක) පළපුරුද්ද.

සහ

(ආ) කාර්ය සාධන ඇගයීම් ක්‍රම පද්ධතිය මත පදනම්ව, විශිෂ්ට / අනර්ඝ කාර්ය සාධන වාර්තාවක් සහිත අධ්‍යාපන ආයතන සඳහා (ශාස්ත්‍රාලීය) සංවර්ධන සැලසුම් සකස් කිරීම පිළිබඳ පළපුරුද්දක් සහ පර්යේෂණ කටයුතු පිළිබඳ පළපුරුද්දක්ද සහිත අය හට ප්‍රමබතාවයක් දක්වනු ලැබේ.

**බාහිර අපේක්ෂකයින් :**

(අ) අදාළ විෂය ක්ෂේත්‍රයක මාස්ටර් (පශ්චාත්) උපාධියක් (විද්‍යාපති / ශාස්ත්‍රපති) සමග ශාස්ත්‍රීය අධ්‍යයන / පර්යේෂණ කටයුතු පිළිබඳ වසර 18 ක පශ්චාත් යෝග්‍යතා (සුදුසුකම් ලැබීමෙන් පසු ලත්) පළපුරුද්ද. ඉන් අඩුම තරමින් වසර පහක් (05) උසස් අධ්‍යාපන ආයතනයක, ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතුය.

(ආ) ශාස්ත්‍රාලයීය අධ්‍යයන ආයතන සඳහා සංවර්ධන සැලසුම් සකස් කිරීම පිළිබඳ පළපුරුද්දක් සහ පරීක්ෂණ කටයුතු වැඩ සම්බන්ධව පළපුරුද්දක් සහිත අය හට ප්‍රමුඛත්වයක් දක්වනු ලැබේ.

**වැටුප් පරිමාණය :**

HM 2 - 1 - 2016 රු. 91,645 - 12 x 2,700 - 124,045.

**වෙනත් ප්‍රතිලාභ :**

රජය අනුමත කර ඇති දීමනා ද සමග වෙන් කරන ලද රථවාහනයක්.

**සේවා කොන්දේසි :**

01. තෝරාගනු ලබන අපේක්ෂකයින් ස්වකීය ඉපයීම් වලින් 10% ක්ද, SLIATE විසින් සිය අරමුදල් වලින් ඔවුන්ගේ ඉපයීම්වලින් 15% ක්ද වශයෙන් සේවක අර්ථ සාධක අරමුදලට (EPF) දායකත්වය දරනු ඇති අතර, ආයතනය විසින් සේවා නියුක්තයින්ගේ භාර අරමුදලට (ETF) ඔවුන්ගේ ඉපයීම්වලින් 3% ක් වශයෙන් දායකත්වය ලබාදෙනු ඇත.

02. සියලුම ප්‍රවර්ග සඳහා වයස් සීමාව 45 ට අඩු විය යුතුය. කෙසේවෙතත් එය රජයේ සේවයේ / රාජ්‍ය අංශයේ ස්ථිර සේවයේ නියුතු අයහට බලනොපානු ඇත.

03. රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් ස්වකීය අයදුම්පත්, අදාළ ආයතන ප්‍රධානින් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

04. රජයේ දෙපාර්තමේන්තුවල, විශ්‍රාම වැටුප් සහිත තනතුරු හොබවනු ලබන තෝරාගනු ලැබූ අයදුම්කරුවන් ආයතන අධ්‍යක්ෂක ජනරාල් වෙතින් ස්වකීය මුදාහැරීම ලබාගත යුතුය. කෙසේ වෙතත් ඔවුන්ට SLIATE හි, සේවා කාලය තුළදී විශ්‍රාම වැටුප් අයිතිත්වලට හිමිකම් නොලැබෙනු ඇත.

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනෙන් පසුව ලැබෙන (ප්‍රමාද) අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**අධ්‍යක්ෂ ජනරාල්,**
**ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය (SLIATE),**
**අංක 320, T.B. ජයා මාවත, කොළඹ 10.**